# පුරාණ යුගයේ අනුරාධපුර ප්‍රදේශයේ පැවති කෘෂිකර්මාන්තය පිළිබඳ අධ්‍යනයක්

*පීරිස් එච්.ඒ.එම් [1] ජයසූරිය කේ.ඒ.ජේ.එස්. [2]*

ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ ලිඛිත ඉතිහාසයක් සහිත ඓතිහාසික නගරයක් ලෙස අනුරාධපුර නගරය පෙන්වා දිය හැකිය. ලංකාවේ පළමු ජනාවාසකරණයේ සිට අද දක්වාම ජනාවාස දක්නට ලැබෙන මෙම ප්‍රදේශය තුළ වර්ෂාපතන තත්ත්වය තරමක් අඩු වුවද පවතින භූ විෂමතාවයන් හා අනෙකුත් ස්වභාවික සාධක මත දියුණු තත්ත්වයක් පවතියි. කෘෂිකර්මාන්තයේ පැහැදිලි වර්ධනයක් දක්නට ලැබෙන මෙම ප්‍රදේශය තුළ අතීත දැනුම් පද්ධතිය තුළ වගා සංග්‍රාමයන් කෙරෙහි පැවති ක්‍රමවේදයන් විවිධ වේ. විවිධාංගීකරණය වූ ජල කළමනාකරණය සහිත කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම පිළිබඳ අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයේ අරමුණ වේ. ප්‍රාථමික හා ද්විතීයික දත්ත මූලාශ්‍රයන් ලෙස සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් සහ ගම්වාසීන් සමඟ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතා කරමින් මෙකී දත්ත රැස් කිරීම සිදු කරගන්නා ලදී. සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය මඟින් කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම වල විකාශනය සහ අනුරාධපුර වියළි කාලගුණික පරිසරය තුළ සමෘද්ධිමත් වීමට පුරාණ ප්‍රජාවන් විසින් භාවිතා කරන ලද අනුවර්තන උපාය මාර්ග සොයා ගනී. ශුෂ්කත්වයේ අභියෝග ජය ගැනීම සඳහා ජල සම්පත් ප්‍රයෝජනයට ගැනීම, කාර්යක්ෂම වාරිමාර්ග පද්ධති සැකසීම සහ නියඟයට ඔරොත්තු දෙන භෝග වගා කිරීම සඳහා මුල් පදිංචිකරුවන්ගේ දක්ෂතාවය මෙම සොයා ගැනීම් මඟින් පැහැදිලි වේ. කෘෂිකාර්මික සාම්ප්‍රදායන් සහ ජල කළමනාකරණ ක්‍රමෝපායන් හැඩගැස්වීමේ දී ආගමික හා සංස්කෘතික පිළිවෙත්වල කාර්යභාරය ගවේෂණය කරයි. එනම් අනුරාධපුරයේ බොහෝ බෞද්ධ විහාරස්ථාන කෘෂිකාර්මික කටයුතු වල මධ්‍යස්ථාන වන අතර උත්සව හා චාරිත්‍ර මඟින් අස්වනු නෙළන කාලය සමරමින් සරුසාර බෝග සඳහා ආශිර්වාදය පතා ඇත. මීට අමතරව කලාපයේ ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර ඉඩම් පරිහරණය සහතික කිරීම සඳහා සාම්ප්‍රදායික දැනුම සහ ප්‍රජා සහයෝගීතාවය උපයෝගී කරගත් ආකාරය පැහැදිලි වේ. එමඟින් ප්‍රජාවන්ට කෘෂිකාර්මික ක්‍රම ස්ථාපිත කිරීමට සහ පවත්වා ගැනීමට හැකි වූ පැරණි ප්‍රඥාව සහ නව්‍ය ප්‍රවේශයන් නිර්මාණය කිරීමට මං මාවත් විවර කරනු ලබයි.

**මුඛ්‍ය පද** - *වියළි කලාපය, භූ විෂමතාව, සමෘද්ධිමත්, කෘෂිකර්මාන්තය, තිරසාර*

---

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යනාංශය සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ annmaleesha1999@gmail.com

[2] පාරිසරික කළමනාකරණ අධ්‍යනාංශය සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ annmaleesha1999@gmail.com